## උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2019

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරේ පවතින තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් **2019 ජූලයි මස** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 10.06.2019 වේ.

**02. සේවා කොන්දේසි :-**

02.1 **2013.04.02** වන දින සිට ක්‍රියාත්මක වන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා බඳවා ගැනීමේ පටිපාටින් හා ආයතන සංග්‍රහයේ විධිවිධාන මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** හා **2013.07.03** වැනි දින දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවා ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගනු ලබන අයදුම්කරුවන් අදාල පළාත් රාජ්‍ය කළමනාකරණ III වැනි ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

02.2 විභාගයෙන් සමත්වන අපේක්ෂකයන් තනතුරුට පත් කරන ලද දින සිට වසර 03 පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර III වනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගත් දින සිට වසර 03 ක කාලය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වූ සේවයකි. එබැවින් මෙම තනතුරට පත් කරනු ලබන අයදුම්කරුවන් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන නියෝගයට යටත් කරනු ලැබේ.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන අපේක්ෂකයකු එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළ යුතුයි යන නියෝගය අනිවාර්ය නියෝගයකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 සහ මේ සම්බන්ධයෙන් නිකුත් කරණු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂාව සමත්විය යුතුය.

02.6 පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරණු ලබයි. ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ල සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය. පත්කිරීමට නියමිත සංඛ්‍යාව **68** කි. විවෘත තරඟයෙන් පත් කරනු ලබන නිලධාරී සංඛ්‍යාව **පවතින පුරප්පාඩුවලින් 70% ක්** වේ.

**03. වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර **MN-2-2016** ට අනුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරේ III වන ශ්‍රේණියේ තනතුර සඳහා ශුද්ධ වැටුප් පරිමාණය **රු. 28,940 - 10 x 300/= - 11 x 350/= - 10 x 560/= - 10 x 660/= - රු 47,990 ක් වේ.** (රු. 29,840/= වැටුප් පියවරට ප්‍රථම පළමු කාර්යක්‍ෂමතා කඩඉම සමත් විය යුතුයි) කෙසේ වුව ඉහත චක්‍රලේඛයට අනුකූලව උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**04. සුදුසුකම්:-**

04.1 අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. මෙම අයදුම්පත භාරගන්නා අවසන් දිනට ප්‍රථම වසර 06 කින් අවම වශයෙන් වසර 03 ක් වත් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවෙකු විය යුතුය.

**හෝ**

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අඩුම වශයෙන් වසර 05 ක් වත් උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුය. (***සම්මුඛ පරීක්ෂණයේදී** ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.)

04.3 අයදුම්කරු උතුරු පළාතේ පිහිටි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි වන පරිදි මනා ශාරීරික යෝග්‍යතාවයකින් හා මනා චරිතයකින් හෙබි පුද්ගලයකු විය යුතුයි.

04.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර නිවේදනය මගින් දන්වා ඇති සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු ය

04.5 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට **නොඅඩු** හා 30 ට **නොවැඩි** වියු යුතුය.

## 05 අධ්‍යාපන හා අනෙක් සුදුසුකම්:-

### (05.1) අධ්‍යාපන සුදුසුකම්

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් ප්‍රධාන විෂයන් වශයෙන් භාෂාව (සිංහල /දෙමළ /ඉංග්‍රීසි) හා, ගණිතය ඇතුළු විෂයයන් හතරකට (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 කින් සමත් විය යුතුයි.

**ඒ සමගම**

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් පොදු පරීක්ෂණය හා පොදු ඉංග්‍රීසි භාෂාව හැර මූලික විෂයයන් සියල්ල එක්වර සමත් වී තිබිය යුතුයි. පැරණි විෂය මාලාව නම් විෂයයන් හතරකින් (4) විෂයයන් තුනක් (03) එකවර සමත් වී තිබීම ප්‍රමාණවත්ය.

### (05.2) අනෙකුත් සුදුසුකම් :

(අ) සේවයට බඳවා ගැනීම බඳවා ගැනීමේ පදනමින් නියෝජනය වන අතර. උතුරු පළාතට අයත් එක් එක් දිස්ත්‍රික්කයකම ජනගහන ප්‍රතිශතය පරිදි අදාළ දිස්ත්‍රික්ක සඳහා පුරප්පාඩු සංඛ්‍යාව වෙන් කරනු ලැබේ. කිසියම් දිස්ත්‍රික්කයක පූර්ණය කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණක් සුදුසුකම් ලබති.

I. අදාල දිස්ත්‍රික්කයට වෙන් කරන ලද පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම්කරන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පූර්ණය කිරීමට අවස්ථාවක් නැති විටෙක දිස්ත්‍රික්කයේ ජනගහන ප්‍රතිශතය පරිදි උතුරු පළාත තුළ එම දිස්ත්‍රික්කයට ආසන්නව ඇති දිස්ත්‍රික්ක අතර පුරප්පාඩු සංඛ්‍යාව නැවත බෙදා වෙන් කරනු ලැබේ

II. පත් කිරීමට අපේක්ෂා කරන පුරප්පාඩු සංඛ්‍යාව ඉතාමත්ම අඩු නම් මෙම තත්වය මත දිස්ත්‍රික්කයේ ජනගහන ප්‍රතිශතය පදනම් කරගෙන පුරප්පාඩු පූර්ණය කළ නොහැකි තත්වයක් උදාවන විට කුසලතා මට්ටමින් සුදුස්සන් තෝරාගැනීමට කටයුතු කරනු ලැබේ

III. විභාගයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණයට වඩා අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගත් අයදුම්කරුවන් සිටින විට එම සංඛ්‍යාව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුනම් දිස්ත්‍රික්කයේ ජනගහන ප්‍රතිශතය පදනම් කර තෝරා ගැනීමක් සිදු නොවේ

**(ආ) දිස්ත්‍රික්කයට අයත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම්**

දිස්ත්‍රික්කයක පවති පුරප්පාඩු සඳහා තරග කරන්නේ නම් පහත් සඳහන් කරුණුවලින් එක් කරුණක් අවම වශයෙන් සම්පූර්ණ වී තිබිය යුතුයි

I. අයදුම්කරු එම දිස්ත්‍රික්කයේ උපන් කෙනෙකු විය යුතුයි

**හෝ**

II. විභාගය සඳහා වූ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනට පෙර අවුරුදු පහකින් **(05)** අවුරුදු තුනක්වත් **(03)** අවම වශයෙන් එම දිස්ත්‍රික්කයේ අඛණ්ඩව පදිංචිකරුවක විය යුතුයි.

**හෝ**

III. විභාග අපේක්ෂකයා එම දිස්ත්‍රික්කයේම අවුරුදු පහක් **(05)** අඛණ්ඩව ද්විතීය පාසැල් අධ්‍යාපනය ලැබූ අයෙකු විය යුතුයි

**සටහන:**

I. යම්කිසි අයදුම්කරුවකුගේ මව හෝ පියා රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ සංස්ථාවක ස්ථාන මාරු සහිත රාජ්‍ය සේවයක් දැරුවේ නම් එම අයදුම්කරු තම පියාගේ හෝ මවගේ හෝ තමා උපන් ස්ථානය තමාට අදාල දිස්ත්‍රික්කය වශයෙන් තෝරා ගැනීමට අවස්ථාව දෙනු ලැබේ

II. කිසිම අයදුම්කරුවකුට එක් දිස්ත්‍රික්කයකට වඩා වැඩි දිස්ත්‍රික්කවල ඇති පුරප්පාඩු සඳහා තරඟ කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. ඉහත **05.2 (ඈ)** කොටස යටතේ තරඟ කිරීමට තීරණය කළ දිස්ත්‍රික්කය නැවත වෙනස් කිරීමට අවස්ථාව නොලැබේ.

**(ඉ) පත්වීම තෝරා ගැනීමට අදාළව දිස්ත්‍රික්ක හා එම දිස්ත්‍රික්ක අංක පහත සඳහන් වේ :-**

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් අංකය |
|---|---|
| යාපනය | **01** |
| මන්නාරම | **02** |
| වවුනියාව | **03** |
| කිලිනොච්චිය | **04** |
| මුලයිතිව් | **05** |

**සටහන :** අයදුම්පත්‍රයේ **12** වන ඡේදය යටතේ මෙම කරුණු සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ තවද පත්වීම සඳහා දිස්ත්‍රික්කය තීරණය කිරීමෙන් අනතුරුව එය නැවත වෙනස් කළ නොහැකිය

## 06 බඳවා ගැනීමේ ක්‍රමය:-

06.1 ලිඛිත පරීක්ෂණයක් පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දි බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනීමේ පරිපාටිය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදීන් පරිදි බඳවා ගැනීමේ කටයුතු සිදු කරනු ලැබේ. මෙම දැන්වීම මගින් කැඳවන ලද සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දි පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර ලබා ගැනීම සඳහා වූ හිමිකම අවලංගු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දි සුදුසුකම් පරීක්ෂා කරන විට ලකුණු ප්‍රදානය කරන්නේ නැත.

06.2 ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන අපේක්ෂකයින්ගෙන්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් ලැබූ මුලු ලකුණු සංඛ්‍යා අනුපිළිවෙල පරිදි සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ

06.3 කළමනාකරණ සහකාර III වන ශ්‍රේණිය සඳහා පවතින පුරප්පාඩු වලින් 70% ක් විවෘත තරඟ විභාගයෙන් සුදුසුකම් ලබන අපෙක්ෂකයන්ගෙන් පුරවනු ලැබේ

06.4 පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් සියයට තුනක් (03%) ආබාධිතයන් සඳහා වෙන් කරනු ලැබේ තෝරා ගනු ලබන අපේක්ෂකයන් ලිඛිත විභාගයෙන් එක් එක් ප්‍රශ්ණ පත්‍රය සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු අතර සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 50% ක් ලබාගත යුතුයි. පත්වීම සඳහා තෝරා ගන්නා අපේක්ෂකයකු තම ආබාධිත තත්ත්වය අදාල තනතුර දැරීමට බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය වාර්තාවක් මගින් සනාථ කළ යුතුයි

**සටහන :**

අපේකෂකයා ආබාධිතයන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන යටතේ විධිමත් පරිදි ඉල්ලුම් කර ඇති බව අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතු අතර ආබාධිතයකු නොවන අපේක්ෂකයෙක් තමා ආබාධිතයකු බව සඳහන් නොකළ යුතුයි.

## 07 විභාග ගාස්තු :-

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 500/= ක මුදලක් **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමාගේ අංක 3401** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කරන්නේ නැත.

**08 ඉල්ලුම් කිරීමේ පිළිවෙළ :-**

08.1 මෙම දැන්වීමේ අග දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ (සෙමී 21 x සෙමී 29) ප්‍රමාණයේ කොළයක 1 සිට 11.2 දක්වා වු ඡේද පළමු පිටුවේද, ඉතිරි ඡේද අනෙක් පිටුවේද අඩංගුවන පරිදි ඉල්ලුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය **10.06.2019** වැනි දිනට හෝ ඊට පෙර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත අංක 393/48, කොවිල් පාර, නල්ලූර්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

08.2 අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර** III **වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබාගැනීම වඩාත් ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවනු ලැබීම අයදුම්කරු විසින් සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.

08.4 ඉල්ලුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන්ට විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට කලින් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් ඒ බව වහාම පහත සඳහන් විස්තර සමඟ **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කොවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය **021- 221 9939**, පැක්ස් අංකය **021- 221 9940**)

**සටහන:** විස්තර ඇතුළත් ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල් ලිපිනය, ඉල්ලුම්පත්‍රයේ පිටපතක්, ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, සහතික කරන ලද විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු පැක්ස් අංකය.

**09 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම:-**

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකි පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. ඒ සඳහා පහත සඳහන් කුමක් හෝ ලේඛනවලින් එකක් පිළිගනු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(11) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (පාස්පෝට් බලපත්‍රයක්)

ඉහත සඳහන් ලියකියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් පනවන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත්විය යුතුය. එම රෙගුලාසිවලට පටහැනිව ක්‍රියා කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් පනවන දඬුවමකට යටත්විය යුතුය.

**10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්-**

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රයේ තොරතුරු ඉදිරිපත් කරන විට ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. විභාග රෙගුලාසිවලට අනුව යම්කිසි අපේක්ෂකයකු දැන දැනම අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වෙන විට හෝ පසුව, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ වැරදි තොරතුරක් සපයා ඇති බව හෝ කිසියම් කරුණක් වසන් කර ඇති බව අනාවරණය වුවහොත්, ඔහු /ඇය සේවයෙන් පහ කිරීමට හේතුවනු ඇත.

## 11 විභාග පරිපාටි :-

ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත වේ. විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යයන් මඟින් පැවැත්වීමට නියමිතය. අයදුම්කරු එකම භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යයේ වෙනසක් සිදු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අභියෝග්‍යතා පරීක්ෂණය | අංක ගණිතමය හැකියාව හා තර්කාණුකූලව තීරණ ගැනීමේ හැකියාව, සාමාන්‍ය බුද්ධිය මැන බැලීම සඳහා සකස් කරන ලද විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්න ඇතුලත් ප්‍රශ්න පත්‍රයකි | පැය 01යි | 100 යි |
| 02 | භාෂා දැනුම | විනිවිදභාවය, ග්‍රහණයකර ගැනීම, අක්ෂර වින්‍යාසය භාෂාව හා රචනය ලිපි ලිවීම, ඉදිරිපත් කරන දත්ත උපයෝගි කර කෙටුම්පත් හා ලේඛන සකස් කිරීම, ඡේද කෙටියෙන් ලිවීම, සපයා ඇති වාක්‍ය වල අන්තර්ගතය තනි වාක්‍යයක් ලෙස සකස් කිරීම, සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න ඇතුළත් වේ | පැය 02 1/2 යි | 100 යි |

**සටහන :-**

මෙම පත්වීම සඳහා සුදුසුකම් ලබා ගැනීමට ලිඛිත පරීක්ෂණයේ ප්‍රශ්ණ පත්‍ර සියල්ලටම අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුවේ. සමස්ත ලකුණුවලින් අවම වශයෙන් ලකුණු 50% ක් ලබා ගත යුතුයි.

## 12 විභාග ප්‍රතිඵල :-

අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් **www.np.gov.lk** යන උතුරු පළාත් සභා අන්තර් ජාලයේ පළ කරන අතර විභාගයට ඉදිරිපත් වූ සියලුම විභාග අපේක්ෂකයන්ට උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් තැපැල් මගින් යොමු කරනු ලැබේ.

## 13 විභාගය පැවැත්වෙන නගර හා නගර අංක පහත් සඳහන් වේ

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලතිව් | 05 |
| තුණුක්කායි | 06 |
| චාවකච්චේරිය | 07 |
| පේදුරුතුඩුව | 08 |
| මඩු | 09 |
| වේලනයි | 10 |

එක් නගරයක් වෙනුවෙන් ලැබෙන අයදුම්පත්වල සංඛ්‍යාව අඩු වූ අවස්ථාවකදී ළඟම ඇති නගරයක විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ

**14** මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය "**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්** සතු වේ. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

***අ. සිවබාලසුන්දරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
09.05.2019